Alcohol and Drug Information Centre
ADIC

No.40/18, Park Road, Colombo 5, Sri Lanka.
Tel: +94 11 2584416, +94 11 2592515, Fax: +94 11 2508484
E-mail: info@adicsrilanka.org, adicc@sltnet.lk
Web Site: http://www.adicsrilanka.org

ලෝක මද්‍යසාර නිවාරණ දිනය යෙදී තිබෙන්නේ ඔක්තෝම්බර් මස 03වන දිනටය. එහෙත් මද්‍යසාර පිළිබඳව සාකච්ඡා කිරීමට සහ ඒ ගැන ක්‍රියාත්මක වීමට මෙම සුවිශේෂී දිනයන් පමණක් නොසෑහේ. මද්‍යසාර භාවිතය ලොව පුරා මිනිසුන්ගේ සතුට, සෞඛ්‍ය සහ සංවර්ධනය අඩාල කරවන, මිනිසුන් රෝගී කරවන, පුද්ගලයින්ගේ ජීවිත හා පවුල් මෙන්ම සමාජයද බිඳවැටීමකට ලක් කරන ප්‍රධාන සාධකයක් බවට පත්ව ඇත .

මද්‍යසාර භාවිතය මිනිසුන්ට වැළඳෙන ලෙඩරෝග රැසකට දායක වන ප්‍රධාන සාධකයක් වන අතර මධ්‍යම ආදායම් ලාභී රටවල මිනිසුන්ගේ අකල් මරණවලට හා ආබාධවලට ලක්කරවන හේතු ලැයිස්තුවේ ඉහලින්ම පවතින්නේ ද මද්‍යසාර භාවිතයයි. එය ලෙඩරෝග 60කට ප්‍රධානතම හේතු සාධකයක් වන අතර තවත් රෝග තත්ත්ව 200ක් සෑදීමට දායක වේ. (මද්‍යසාර පිළිබඳ ගෝලීය තත්ත්ව වාර්ථාව 2004)

මද්‍යසාර පිළිබඳව කතා කරන විට දැනට ලංකාවේ මද්‍යසාර භාවිතය හේතුවෙන් වසරකට 23000කට ආසන්න ප්‍රමාණයක් මියයනු ලැබේ. එමෙන්ම ලංකාවේ මිනිසුන් අරක්කු සඳහා දිනකට රුපියල් මිලියන 247ක් ද බියර් සඳහා දිනකට රුපියල් මිලියන 58ක්ද වියදම් කරන බව මද්‍යසාර සමාගම් වල වාර්තා වල සඳහන් වේ.

මද්‍යසාර භාවිතය හේතුවෙන් රෝගී වුවන්ට සෞඛ්‍ය වියදම ලෙස රුපියල් බිලියන 145 ක් වැය වේ. (WHO මද්‍යසාර සිගරට් පිරිවැය වාර්තාව 2015). මෙම වියදම රජයට ආර්ථිකමය වශයෙන් ප්‍රබල බලපෑමක් ඇති කරයි. මෙසේ රටේ සංවර්ධනය අඩාල කරවන, සතුට අහිමි කරවන, මිනිසුන් රෝගී කරවන මද්‍යසාර මේ තරම් රසවත් දෙයක් ලෙස රටපුරා ව්‍යාප්ත වීමට බලපාන හේතුව කුමක්ද?

මද්‍යසාර සමාගම්වල ඉලක්කය වන්නේ ඔවුන්ට අවශ්‍ය පරිදි මිනිසුන් මේ සඳහා හුරු කිරීමයි. ඒ සදහා මද්‍යසාර සමාගම් විවිධ උපායන් යොදාගනිමින් ඍජුව හෝ වක්‍රව ප්‍රචාරණයන් සිදුකරයි. මද්‍යසාර පිළිබඳව ප්‍රතිපත්ති සම්පාදනය වී පැවතිය ද ඒවා ක්‍රියාත්මක වීමට අවශ්‍ය නීති කෙටුම්පත් සකස්වී නොමැත. මද්‍යසාර පාලනය පිළිබඳ ප්‍රතිපත්තියෙහි පවතින අරමුණු ළඟාකර ගැනීමට ප්‍රධාන විෂයපථයන් 10ක් ඔස්සේ කතා කරයි. නමුත් මේ ප්‍රතිපත්ති ක්‍රියාත්මක වන්නේද යන්න ගැටළුවකි. උදාහරණයක් ලෙස **මිල නියම කිරිම, වෙළඳාම හා ආයෝජනය** පිළිබඳ කතා කරන විට සැබෑ ලෙසම මෙම ප්‍රතිපත්තිය ක්‍රියාත්මත වේද?

2018 වර්ෂයේ බියර් මිල අඩු වීමක් සිදුවූ අතර මෙයට හේතුව බියර් සඳහා වූ බදු අඩු කිරීමයි. එහෙත් සැබැවින්ම සිදුවිය යුත්තේ බියර් වල මිල වැඩිවීමය. බියර් මිල අඩුවීමත් සමගම පෙර කාලයට සාපේක්ෂව බැලූ කළ බියර් භාවිතයේ වැඩි වීමක් දක්නට ලැබුණි. අඩු මිලට බියර් ලබා ගැනීමට හැකිවීම හේතුවෙන් පාසල් ළමුන් මද්‍යසාර භාවිතයට යොමු වීමේ අවධානමක්ද පවතී. ප්‍රතිපත්ති නිසි ලෙස ක්‍රියාත්මක වන්නේ නම්, විය යුත්තේ 2018 වර්ෂයට පෙර බියර් වල තිබූ මිලට වඩා වැඩි මිලක් ඒ සඳහා නියම කිරීමයි. එසේත් නැති නම් විය යුත්තේ ඊට පෙර පැවති මිල හෝ ඒ අයුරින්ම පවත්වා ගෙන යාමයි .

2018 ඔක්තෝබර් 03 වන දිනට යෙදී ඇති මද්‍යසාර නිවාරණ දිනය පුද්ගයයින් හෝ රටක් වශයෙන් විවිධ ගැටළු රැසකට මුහුණ දෙන මද්‍යසාර ගැටළුව පිළිබඳව ජනතාවට හෙළිකරන්නට සුදුසුම අවස්ථාවකි.

**මද්‍යසාර සහ මත්ද්‍රව්‍ය තොරතුරු මධ්‍යස්ථානය**

**2018.10.02**